Oceanswell
Oceans for all, forever

**Clarification related to comments made on 5th July on Derana TV:**

It has been brought to my attention that on the 5th of July certain comments were made by the State Minister of Urban Development, Coast Conservation, Waste Disposal and Community Cleanliness, Hon. Dr. Nalaka Godahewa in an interview on Derana TV as per below.

This statement is to clarify that I did not have a discussion of this nature with said State Minister at any point in time.

Thank you,
Asha de Vos.

## Interview between Derana TV journalist, Mr Sanka Amarajith and the state minister of Urban Development, Coast Conservation, Waste Disposal and Community Cleanliness, Hon. Dr. Nalaka Godahewa

## TV Derana - Derana 360° | රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා

## 5th July 2021

Term 'වාරකන්' in Sinhalese and 'offseason' in English refers to the South-West monsoon of Sri Lanka.

**The interview happened on-screen as follows**

මාධ්‍යවේදියා - ප්‍රශ්නය. වාරකන් නිසා කැස්බෑවන් මැරෙනවාද?
Journalist - Question. Do turtles die because of the offseason?

ඇමතිවරයා - මම ඒකට උත්තරය දන්නෙ නෑ. හැබැයි මට විවිධ අය කියන දේවල් අනුව මට කියන්න පුළුවන් වාරකන් වලටත් කැස්බෑවන් මැරෙනවා කියලා, පරිසරවේදියෙ නම් මට කියලා තියනවා.
Minister - I don't know the answer to that. But from the things different people have told me, what I can say is that turtles die because of the offseason as well. Environmentalists have told me that.

Oceanswell
Oceans for all, forever

මාධ්‍යවේදියා - දැන් පළවෙනි ප්‍රශ්නෙ තමයි, අතුරු ප්‍රශ්නෙ. වාරකන් තිබ්බත් නැතත් කැස්බෑවො මැරෙනවනෙ, ජීවියෙක් විදිහට ඉපදෙන ඕනෙම කෙනෙක් මැරෙනවා.
Journalist - Now a sub-question of the first question. Turtles die regardless of the offseason, anyone born as a living thing will eventually die.

ඇමතිවරයා - අන්න ඒක තමයි මමත් ඔයාට කියන්නෙ.
Minister - That's exactly what I'm telling you.

මාධ්‍යවේදියා - හරි, දෙවනි එක. වාරකන් කාලයට විශේෂයෙන් කැස්බෑවො මැරෙනවා කියලා ඔබ තුමාට කිව්ව පරිසරවේදියා කවුද? නම මොකක්ද?
Journalist - Okay, the second one. Who was the environmentalist who told you that turtles die during the offseason specifically? What's the name?

ඇමතිවරයා - එහෙම නම කියන එක හරි නෑ නෙ. ලංකාවෙ ඉන්න සුප්‍රකට පරිසරවේදියක්, වේදිනියක් ඇත්තටම. තමයි මට කිව්වෙ ඒක එහෙම වෙනවා කියලා. හැබැයි ඒක එහෙම මහා විශාල පරිමාණයෙන් වෙන දෙයක් නෙමෙයි. කැස්බෑවෙක් දෙන්නෙක් මැරෙනවා වෙන්න පුළුවන් කියලා ඇය කිව්වා. නමුත් වාරකන් නිසා විශාල වශයෙන් කැස්බෑවො මැරෙනවා කියලා මතයක් නෑ.
Minister - It's not correct to mention names like that. A famous environmentalist in Sri Lanka, a female environmentalist. She told me that it happens in that way. But it's not something that happens on a large scale. One or two turtles may die, that's what she said. But there is no such thing as mass turtle deaths that occur during the offseason.

මාධ්‍යවේදියා - දැන් ඔබතුමාගෙ ආසනය තියෙන්නෙ ගම්පහ දිස්ත්‍රික්කයේ. සමුද්‍රාසන්න දිස්ත්‍රික්කයක් නෙමෙයි. ඔබතුමාගෙ ගම කොහෙද?
Journalist - Now your seat is in the Gampaha district. Not a coastal district. Where is your hometown?

ඇමතිවරයා - මගෙ ගම අම්බලන්ගොඩ.
Minister - I'm from Ambalangoda.

මාධ්‍යවේදියා - ආහ් එහෙනන් ඉතිං වාරකන් ඕනතරම් දැකලා ඇතිනෙ. දැන් එතකොට ඔබතුමාගෙ ජීවිතකාලෙ දැකලා තියනවද කැස්බෑවො ඔහොම කැස්බෑවො ගොඩ ගහලා තියනවා?
Journalist - Oh then you may have seen plenty of offseasons. Then now tell if during your lifetime have you seen turtles stranded like this?

ඇමතිවරයා - නෑ නෑ මම දැකලා නෑ.
Minister - No no I haven't seen.

මාධ්‍යවේදියා - ඉතිං එහෙනන් දැන් කොහොමද ඒ ඒ එක පරිසරවේදිනියක් කිව්වා කියලා ඒ නිගමනයට එන්නෙ. විශේෂයෙන්ම මාධ්‍ය ඉදිරියේදී ඒ ප්‍රකාශය කරානෙ.
Journalist - So then how can you come to a conclusion based on what was said by a single female environmentalist. Especially when you made that statement in front of the media.

ඇමතිවරයා - නෑ. අන්න එතන තමයි සංඛ වරද තියෙන්නේ. දැන් ඔබ පාවිච්චි කරානෙ වචනයක්, එහෙම නිගමනයකට එනවා කියලා. මම කිසිම වෙලාවක එහෙම නිගමනයකට ඇවිල්ලා නෑ. කිසිම වෙලාවක මම එහෙම නිගමනයක ඉන්නවා කියලා කියලත් නෑ. මම ඔබට දැනුත් කියනවා මම එහෙම නිගමනයක නෑ. මොකද ඒ සම්බන්ධයෙන් මම පටන් ගන්නකොටම කියනවා මට කිසිම දැනුමක් නෑ මොකද මම පරිසරවේදියෙක් නෙමෙයි. ඒ නිසා දැන් ඔබ මට යමක් කිව්වා කියලා මම කිව්වොත් ඉන් අදහස් කෙරෙන්නෙ නෑ නෙ මම ඒ ගැන දැනුවත් කියලා. මම කියන්නෙ ඔබ මට මෙසේ කීවා.
Minister - No. That is where the mistake is Sanka. Now you said something about concluding. At no point have I come to such a conclusion. I have not mentioned that I have come to such a conclusion anywhere. I’m telling you now too, that I have not reached such a conclusion. Because at the beginning itself I mentioned that I have no knowledge regarding the matter as I’m not an environmentalist.  If I said something which you told me, it doesn’t say that I have knowledge of that matter. I only say that you told me this.

මාධ්‍යවේදියා - ම් ම්
Journalist - Mmm

ඇමතිවරයා - ඉන් අදහස් කෙරෙන්නෙ නෑ මම ඒක පිළිගන්නවා කියලා හෝ මට ඒ පිළිබඳව දැනුමක් තියනවා කියලා. දැන් ඔය, ඔබ ඔය ප්‍රශ්නය අහන්නේ පහුගිය දිනවල මේක මේ ලොකු වාදයක් උනානෙ නාලක ගොඩහේවා කිව්වා කියලා වාරකන් කාලයට කැස්බෑවො මැරෙනවා කියලා.
Minister - It doesn’t mean that I accept it or that I have knowledge regarding it. So now, you are asking this question based on the big debate involving Nalaka Godahewa saying that turtles die during the off-season.

මාධ්‍යවේදියා - ඔව්

Journalist - Yes

ඇමතිවරයා - මම ඔබට මේ ප්‍රසිද්ධියේ, මේ ලක්ෂ සංඛ්‍යාත ප්‍රේක්ෂකයෙ අහන් ඉන්න වෙලාවෙ කියනවා ඒක සම්පූර්ණ විකෘතියක්. මම කිව්වෙ ඒක නෙමෙයි. මම කියපු සම්පූර්ණ කතාව නෙමෙයි අහ් මා.. එක්තරා මාධ්‍ය ජාලවක් විශේෂයෙන්ම ප්‍රචාරය උනේ. ඒ මම කියපු සම්පූර්ණ කතාවෙන් කොටසක් විතරයි කියවුනේ. මට ඒක ඔබට පෙන්නන්න පුළුවන්ද? අවසර තියනවද?

Minister - I'm telling you in public when a hundred thousand viewers are listening to this, that it is a distortion. That's not what I said. The entire story I told was not uh... what a particular media channel specifically broadcasted. It was a part of my full talk. Can I show it to you? Do you have permission?

මාධ්‍යවේදියා - ඔව් ඔව් අපි බලමු.

Journalist - Yes, yes. Let's see it.

ඇමතිවරයා - ඔබට අවසර තියනවනන් මම ඒ කියපු සම්පූර්ණ කතාව, ඒ ක්ලිප් එක පෙන්වන්නන්. දැන් මෙතනදි මගෙන් මාධ්‍යවේදියෙක් අහනවා, මේ මේ මේක උනේ එම් එක්ස් පර්ල් නෞකාව ගිනිගෙන මම හිතන්නෙ දින දෙක තුනකට පස්සෙ, එතකොට වෙරළට කැස්බෑවෙක් එහෙම නැත්තන් දෙන්නෙක් විතර ගොඩගහලා තිබුණා. මේ අද, දැන් අපි දන්නවා වගේ විශාල ප්‍රමාණයේ මරණ සිද්ධ වෙලා තිබුණේ නෑ ඒ වෙලාවෙ. ඒ වෙලාවෙ ඔහු අහනවා මේ සත්තු ගැන ඇහුවහම මම කියපු කතාව මම සම්පූර්ණයෙන් ප්ලේ කරලා පෙන්නන්නං. ඊට පස්සෙ අපි ඒ ගැන කතා කරමු.

Minister - If you have permission I'll show you my full talk, that video clip. This must have been two, three days after the M X Pearl ship's fire when there weren't as many deaths as there are now and only one or two turtle strandings had been reported. A journalist asked me about the dead animals. I'll play the video of my response and we can talk about it after that.

මාධ්‍යවේදියා - හා

Journalist - Okay

ඇමතිවරයාගේ දුරකථනයේ තිබෙනා වීඩියෝ පටයක් පෙන්වයි. පහතින් තිබෙන්නේ එම රූපරාමු තුළ ඇතිවන සංවාදයයි.

**The Minister plays a video on his phone. The following is the conversation in the video.**

මාධ්‍යවේදියා 2 - ඇමතිතුමා මේ වෙනකොට මුහුදෙ ඉන්න සත්ත්වයින් දිගින් දිගටම මැරෙනවා, ගොඩට එනවා. දැන් ඔබ තුමන්ලා මේ සම්බන්ධව මොනවහරි අරං තියනවද, මේ ගැන හොයලා බලනවද, මොකද වෙලා තියන තත්වෙ, අලුත්ම තත්වෙ.
Journalist 2 - Minister, currently many marine animals have died and they keep washing up on shore repeatedly. Have you taken any steps towards this? Are there any investigations happening? What has happened and what is the current status?

ඇමතිවරයා - දැන් මෙන්න මෙහෙම කාරණයක් තියනවා. දැන් අපේ පැත්තෙන් වෙරළ, වෙරළ සංරක්ෂණය පැත්තෙන් ආරක්ෂා කිරීම පැත්තෙන් මම හිතන්නෙ අපි උපරිම වශයෙන් කටයුතු කරලා තියනවා. අපි දැක්කා මේ ළඟදි ලංකාවේ ඉන්න සුප්‍රකටම පරිසරවේදිනියක් වන ආශා ඩි වොස් මහත්මිය මේ මේ වෙබ් පෝස්ට් එකක් දාලා ක්ලිප් එකක් දාලා ස්තූති කරලා තිබ්බා අපේ අමාත්‍යාංශයට මේ වෙරළ සංරක්ෂණය කිරීම සඳහා මේ සති දෙක තුන ඇතුලත අපි මොනතරම් කාර්‍යක්ෂමව ඒ කාර්‍ය කරාද කියන එක. එතකොට මුහුදේ සිද්ධ වන දේ අපිට සම්පූර්ණයෙන් පාලනය කරන්න බෑ. මේ වාරකන් කාලයේ බොහෙ අනතුරු වෙන්නට පුළුවන්. දැන් උදාහරණයක් වශයෙන් මම පරිසරවේදියෙක් නෙමෙයි. නමුත් මට සමහර පරිසරවේදියෙ මම දැක්කා සමාජ ජාල වලත් කියලා තියනවා ඒ වගේම සමහර පරිසරවේදියෙ මාත් එක්ක සෘජුවත් කියලා තියනවා වාරකන් කාලයට සත්තු අනතුරු වලට ලක් වෙනවා. ඉතිං වාරකන් කාලයට ගොඩබිමට සතෙක් ගහගෙන ආවහම ඒක අසාමාන්‍ය සිද්ධියක් වෙන්නේ නෑ නමුත් මේ වෙලාවෙ මේ නැවේ අනතුර තියන නිසා හැම කෙනෙක්ම මේක සෘජුව සම්බන්ධ කරන්න බලනවා ඒකට. ඒකට සම්බන්ධද නැද්ද කියලා මම දන්නෙ නෑ. නමුත් වඩාත් සුදුසු දේ තමයි හොඳ දැනුවත් පරිසරවේදියෙක්ගෙන් අහන එක මේක අසාමාන්‍ය තත්වයක්ද කියලා.
Minister - Now the matter is this. I think we have done up to our maximum capacity in conserving and protecting the coasts. Recently, we saw one of the most famous environmentalists in Sri Lanka, Ms Asha de Vos posted a web post, a clip, thanking our ministry for the efficient work done in conserving the coasts in just two to three weeks. We cannot completely control everything that happens out in the sea. There can be many accidents in these offseasons. Now, for example, I'm not an environmentalist, but I saw some environmentalists mentioned on social media and some even told me directly that animals face accidents in the offseason. So it's not unusual to see a stranding during the offseason. But right now with the threats of the ship, everyone tries to directly connect these events to the ship. I don't know whether it's connected or not. But what's best is to ask this from a knowledgeable environmentalist whether it is an abnormal incident or not.

මාධ්‍යවේදියා 2 - ඇමතිතුමා මේකෙ පරීක්ෂණ වාර්තා තාම ඇවිල්ලා නෑ, මේ සත්ත්වයින්ගෙ, ඒවා ඉක්මනින් දෙන්න බලාපොරොත්තු වෙනවද?
Journalist 2 - Minister there aren't any test reports of the animals available yet. Are you hoping to give them soon?

ඇමතිවරයා - නෑ. පරීක්ෂණ වාර්තා එන්න ඕනේ වනජීවී දෙපාර්තමේන්තුවට. දැන් මගේ අමාත්‍යාංශයට ඒ සම්බන්ධ බලයක් නෑ. වනජීවී අමාත්‍යාංශයෙන් අපි ඉල්ලලා තියනවා පුළුවන් තරන් ඉක්මනට මේ ගැන ප්‍රකාශයක් කරන්න කියලා.
Minister - No. Those test reports should come to the Wildlife Department. My ministry doesn't look over that. We have requested the Wildlife Department to make a statement regarding this as soon as possible.

දුරකථනයෙන් පෙන්වූ වීඩියෝ පටය අවසානයි. දැන් නැවතත් මැදිරිය තුළ සිදුවන සංවාදය පහතින් දැක්වේ.
**The video played on the mobile phone is over. Following is the continuation of the original interview.**

ඇමතිවරයා - දැන් සංඛ මට තත්පරයක් දෙන්න.
Minister - Now give me a second Sanka.

මාධ්‍යවේදියා - ඔව්. ඔබතුමා නම කිව්වෙ නැති උනාට ඔය හඬපටයේ තිබෙනවා ආශා ඩි වොස් මහත්මිය.
Journalist - Yes. Even though you didn't mention the name, that tape had it, Ms Asha de Vos.

ඇමතිවරයා - ආශා ඩි වොස් මහත්මිය, අපිව ප්‍රශංසාවට ලක් කළා කියලා මම කිව්වෙ.
Minister - What I said was, Ms Asha de Vos praised us.

මාධ්‍යවේදියා - ඒ කියන්නෙ ඔය වාරකන් කතාව කිව්වෙ එතුමිය නෙමෙයිද?
Journalist - So it wasn't her who said the story about the offseason?

ඇමතිවරයා - අහ් එතුමියත්. ඒක මම විතරක් නෙමෙයි ඒක එතුමියත් සමාජ ජාලා වල එතුමියගේ මතය ඒකමයි කියලා ප්‍රකාශ කරලා තිබුණා. ඒ කියන්නෙ පරිසරවේදිනියක් වශයෙන් ඇය ඒ මතයේ ඉන්නවා. නමුත් මම කෙනෙක් ගැන

Oceanswell
Oceans for all, forever

පුද්ගලිකවම කතා කරන්න කැමති නෑ මොකද එතුමියටත් ඇති වෙනකන් මඩ ගහනවා මේ දවස් වල ඒක කිව්වා කියලා. එතුමියගේ තියන දැනුම, ඉන් අල්ප මාත්‍රයක්වත් නැති අය එතුමියට උඩ පැන පැන තලනවා මේ දවස්වල එහෙම කිව්වා කියලා. මොකද එතුමිය පැහැදිලිවම එවැනි මතයක් ප්‍රකාශ කරලා තියනවා. හැබැයි සංඛ මම නැවතත් කියනවා මේ මේ මේ වෙලාවෙ විශාල කැස්බෑවො ප්‍රමාණයක්, සත්තු ප්‍රමාණයක්, ඩොල්ෆින් ප්‍රමාණයක් මැරිලා තියනවා. අපි උසාවියට ගිහිල්ලා ඒක කිව්වා. ඉතිං ඒ නිසා අර මගෙන් ඔය ප්‍රශ්නය අහපු වෙලේ තිබ්බ තත්වයත් අද තත්වයත් දෙකක්. මේ ප්‍රශ්නය අහන්නෙ මගෙන් මේ නැව අනතුරකට ලක්වෙලා දින දෙක තුනකට පස්සෙ ඒ නිසා මම මේ ක්ලිප් එකේ තියන කාරනා කීපයක් ඔබට මතක් කරන්නට කැමතියි. මම කියනවා මුලින්ම අපි අපේ වගකීම ඉටු කරලා තියනවා ඒ කියන්නේ වෙරළ සුද්ද කිරීමේ කාර්‍ය කරලා තියනවා. අහන ප්‍රශ්නය සත්තු දිගින් දිගටම මැරෙනවා මේ සම්බන්ධයෙන් මොකක්ද තත්වය කියලා. එතකොට මම කියනවා, මුහුදේ සිද්ධ වෙන දේවල් අපිට පාලනය කරන්න බෑ, වෙරළ පාලනය කරන්න පුළුවන් මුහුදේ සිද්ධ වන දේවල් අපිට පාලනය කරන්න බෑ. මේ වාරකන් කාලයේ බොහෙ අනතුරු වෙන්න පුළුවන්. මම මේ කියන්නෙ කැස්බෑවො ගැන නෙමෙයි බොහෙ අනතුරු වෙන්න පුළුවන් වාරකන් කාලෙ. උදාහරණයක් වශයෙන් මම පරිසරවේදියෙක් නෙමෙයි නමුත් මම දැක්කා සමහර පරිසරවේදියෙ සමාජ ජාලා වල ලියලා තියනවා ඒ සමඟම සමහර පරිසරවේදියෙ මා සමඟ සෘජුවත් කියලා තියනවා වාරකන් කාලයට සත්තු අනතුරු වලට ලක්වෙනවා කියලා. එතකොට මම කියන්නෙ වෙන කෙනෙක් කියපු කතාවක්. හැබැයි ඊටපස්සෙ මම කියනවා නමුත් මේ වෙලාවෙ නැවේ අනතුර තියන නිසා හැම කෙනෙක්ම ඒකට සෘජුව සම්බන්ධ කරන්න බලනවා. ඒකට සම්බන්ධද නැද්ද කියලා මම දන්නෙ නෑ.

Minister - Uh.. she also. It wasn’t just me, she also stated on social media that she has the same opinion. So as an environmentalist, that means she has this opinion. But I don’t like to discuss any individuals particularly because she has also now become a target of mudslinging, because of this statement. People without even a drop of the knowledge she possesses are now attacking her continuously because she said this. Because she clearly stated this opinion. But Sanka I’m repeating this, this, right now there are a huge number of turtle, animal and dolphin deaths that have happened. We told this at the court. So the present situation and the situation when that question was asked from me, is totally different. I was asked this question after two, three days of the fire so I would like to remind you of a few things from that clip. First, we have fulfilled our duty, meaning we have done the task of cleaning the beach. The question asked was what measures have been taken

regarding the increasing deaths of the animals. To this, I said we can't entirely control everything that happens out in the sea. We can control what's happening on the coasts but not in the sea. In these offseasons, many accidents may occur. I'm not talking about turtles, many accidents can happen in the offseason. For example, I'm not an environmentalist, but I saw some environmentalists mentioned on social media and some even told directly that accidents happen in the offseason. Therefore, I'm saying something which someone else said. But after that I said, because of the threat from the ship, everyone is trying to make connections between the ship and the deaths. I don't know whether there is a connection or not.

මාධ්‍යවේදියා - ම්
Journalist - Mmm…

ඇමතිවරයා - ඒ මම කියන්නෙ මේ මේ මේක සම්බන්ධද නැද්ද කියලා මම දන්නෙ නෑ. මම හිතන්නෙ වඩාත්ම සුදුසු දේ තමයි හොඳ දැනුමක් තිබෙන පරිසරවේදියෙක්ගෙන් අහන එක මේක අසාමාන්‍ය තත්වයක්ද කියලා. දැන් මේකෙ මාධ්‍ය වල ගියේ මේ කෑල්ල නැතුව එතකොට මාධ්‍යවල මම මුලින් කියන කෑල්ලත් නෑ අන්තිමට කියන කෑල්ලත් නෑ අර පරිසරවේදියා කිව්ව කිව්වෙ කෑල්ල පමණයි යන්නෙ. එතකොට හරියට මම කියනවා වගේ කතාව. ඕක තමයි වෙච්ච පටලැවිල්ල.
Minister - What I'm saying is that I don't know whether it's connected or not. What I think the most appropriate thing to do would be to ask a knowledgeable environmentalist whether this is an unusual thing or not. Now the media reported this without this part. So the first part and the last part are missing and only the part where I quoted the environmentalist is being broadcast. It then looked like I was telling the story. That was the mess that happened.